ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

2019 වාර්ෂික වාර්තාව

අපගේ දර්ශනය

අප රට ආර්ථිකයෙහි සියලු අංශවලට අදාළව ප්‍රමිතිකරණය සහ තත්ත්වය වැඩි දියුණු කිරීමේ කාර්යයන් ඉටු කරමින් ජාතික ජීවන තත්ත්වය සුපෝෂණය කිරීම පිණිස නායකත්වය ලබා දෙන්නා වූ අග්‍රගණ්‍ය ජාතික සංවිධානය බවට පත්වීමය



මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ ආයතනයේ සේවාලාභීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරන අතර ජාතික ආර්ථිකයෙහි සියලුම අංශවල ප්‍රමිතිකරණය, මිනුම්, තත්ත්ව ආරක්ෂණය සහ ආශ්‍රිත කාර්යයන් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසු කිරීම තුළින්

- ඵලදායිතාව වැඩි කිරීම සහ සම්පත් පරිහරණය උපරිම කිරීම
- අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම පහසු කිරීම
- සමාජ ආර්ථික සංවර්ධනය ලභා කර ගැනීම
- භාණ්ඩ හා සේවාවන්ගේ අන්තර්ජාතික තරහකාරීත්වය වර්ධනය කිරීම සහ
- පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීමයි.

ගරු තාක්ෂණ ඇමතිතුමා වෙත

ගරු ඇමතිතුමනි,

2019-01-01 දින සිට 2019-12-31 දින දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව එම ආයතනයෙහි මහා මණ්ඩලයේ සාමාජිකයින් වෙනුවෙන් 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කරමි.

මෙයට

ඔබගේ විශ්වාසී

අත්සන් කලේ
සභාපති
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

පටුන

	පිටු අංක
මහා මණ්ඩල සාමාජිකයන්	06
ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මඩුල්ල	07
හැඳින්වීම	08
2019 වර්ෂයේ වැදගත් සිදුවීම්	09
ආදායම් උපයන ක්‍රියාකාරකම්	13
ආයතනයේ ආංශික ක්‍රියාකාරකම්	
විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය	14
ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය	18
පද්ධති සහතිකකරණ අංශය	19
තත්ත්ව ආරක්ෂණ අංශය	22
පුහුණු අංශය	23
අලෙවි හා ප්‍රවර්ධන අංශය	24
පරීක්ෂණාගාර සේවා අංශය	25
මිතිවිද්‍යා අංශය	33
ප්‍රලේඛන හා තොරතුරු අංශය	34
නිෂ්පාදිත සහතිකකරණ අංශය	35
පරිපාලන අංශය	37
තොරතුරු තාක්ෂණ ඒකකය	38
මුදල් අංශය	40
අභ්‍යන්තර විගණන	40
මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද විද්‍යාත්මක ප්‍රමිති ලැයිස්තුව	41
මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉංජිනේරු ප්‍රමිති ලැයිස්තුව	55
විදේශීය පුහුණු	59
දේශීය පුහුණු	61
විදේශ විගණන	63
කාර්ය මණ්ඩල තොරතුරු	65
ආංශික කමිටු සංයුතිය	66
2019-12-31 දිනට මූල්‍යමය තත්ත්වය පිළිබඳ වාර්තාව	73
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වාර්තාව	74
විගණකාධිපතිතුමාගේ වාර්තාව	109
විගණකාධිපතිතුමාගේ වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් දැක්වීම	114

ලිපිනය

නො, 17 වික්ටෝරියා පෙදෙස
ඇල්විටිගල මාවත
කොළඹ 08
දුරකථනය: 2671567 - 72
2697039, 2674618
ටෙලිෆැක්ස්: 2687523, 2671579,
2672617, 2672616
විද්‍යුත් තැපෑල: slsi@slsi.lk
වෙබ් අඩවිය: http://www.slsi.lk



දුරකථන අංක

සභාපති	2671573
අධ්‍යක්ෂ ජනරාල්	2671574
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	2671575
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	2697029

අංශ



විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය	2672614
ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය	2672612
තත්ත්ව ආරක්ෂණ අංශය	2671578
නිෂ්පාදිත සහතිකකරණ අංශය	5626204
පරීක්ෂණාගාර සේවා අංශය	2694985
මිතිවිද්‍යා අංශය	2674619
පද්ධති සහතිකරණ අංශය	2672613
ප්‍රලේඛන හා තොරතුරු අංශය	2672615
පුහුණු අංශය	2685546
අලෙවි හා ප්‍රවර්ධන අංශය	2694981
පරිපාලන අංශය	2671576
මුදල් අංශය	2671577



සභාපතිතුමාගේ පණිවිඩය

2019 වසර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ඉතා සාර්ථක වූයේ එය අපේක්ෂිත ඉලක්ක සපුරා ගනිමින් සහ අදාළ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කරමින් සිය මෙහෙවර අඛණ්ඩව කරගෙන ගිය බැවිනි.

2019 වසර තුළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සිය දිගු ඉතිහාසය තුළ ඉහළම ආදායමක් උපයා ගනිමින් ස්වයං- පරියාප්ත තත්ත්වය පවත්වා ගැනීමට සමත් විය.

ආරම්භයේ සිටම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමාණයෙන් වර්ධනය වී සිය සේවා පරාසය පුළුල් කර ඇත.

එය විශේෂයෙන්ම විවෘත ආර්ථික යුගයක් තුළ පාරිභෝගිකයන් වෙත සපයනු ලබන නිෂ්පාදන සහ සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ක්‍රියා කරයි.

2019 වසරේ අපගේ ගමන සාර්ථක කර ගැනීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් මහා මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට, අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිද්ධිකා සේනාරත්න මහත්මියට, කළමනාකරණ කණ්ඩායමට සහ ආයතනයේ සියලුම සේවකයින්ට ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අපි 2020 දක්වා ගමන් පථය දිගටම කරගෙන යාමට බලාපොරොත්තු වෙ.

අත්සන් කලේ
ආචාර්ය නුෂාඩ් එම් පෙරේරා
සභාපති
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය



අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ පණිවුඩය

2019 වසර සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් යැවීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) ශ්‍රී ලංකාවේ එකම නියෝජිතයා ලෙස 2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) ආයතනයේ ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා නව මුලපිරීම් ගෙන ඇත්තේ වඩා කර්මාන්තයට සහ වෙළඳාමට හොඳ සේවාවක් සැපයීමේ ප්‍රමුඛ අරමුණෙන් වේ.

මෙම මෙහෙයුමේ ප්‍රතිඵලයක් ලෙස මෙම වසරේදී ආයතනයේ ස්වයං-පරියාප්ත තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා ඉතිහාසයේ විශාලතම ආදායම වන වාර්ෂික ආදායම මිලියන 80 කින් ඉහළ නැංවීමට ආයතනයට හැකි වූ බව සතුටින් දන්වා සිටිමි.

අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිතුමා වෙත ජාතික තත්ත්ව ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමට හැකිවීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට 2019 වසරේ විශේෂත්වය විය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයට කෙතරම් දායකත්වයක් ලබාදී ඇත්ද යන්න පිළිබඳව අප ආඩම්බර විය යුතුය.

ගරු අමාත්‍යතුමාට, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමාට, මහා මණ්ඩලයේ සභාපතිතුමාට සහ සාමාජිකයින්ට මාගේ අවංක ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මගේ පූර්වගාමීන්, සමස්ත කළමනාකාරීත්ව කණ්ඩායම සහ මගේ කාර්ය මණ්ඩලයේ සෑම මට්ටමකම කැපවීම සහ ලබා දුන් අගනා දායකත්වය සඳහා මගේ කෘතඥතාව දැක්වීමට කැමැත්තෙමි.

අත්සන් කළේ
ආචාර්ය සිද්ධිකා සේනාරත්න
අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

ආයතනික ව්‍යුහය


සභාපති
සහ
මහා මණ්ඩල
සාමාජිකයින්
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ
විද්‍යාත්මක
ප්‍රමිතිකරණ
අධ්‍යක්ෂ
අලෙවි හා
ප්‍රවර්ධන
අධ්‍යක්ෂ
නිෂ්පාදිත
සහතිකකරණ
අධ්‍යක්ෂ
මිනි විද්‍යා
අධ්‍යක්ෂ
තත්ත්ව
ආරක්ෂණ
අධ්‍යක්ෂ
මුදල්
අධ්‍යක්ෂ
පරිපාලන
අධ්‍යක්ෂ
ඉංජිනේරු
ප්‍රමිති
අධ්‍යක්ෂ
ප්‍රලේඛණ හා
තොරතුරු
අධ්‍යක්ෂ
පුහුණු
අධ්‍යක්ෂ
පද්ධති
සහතිකකරණ
අධ්‍යක්ෂ
පරීක්ෂණාගාර
සේවා
ජ්‍යෙෂ්ඨ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
අභ්‍යන්තර
විගණන
ජ්‍යෙෂ්ඨ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
තොරතුර තාක්ෂණ
ඒකකය
ජ්‍යෙෂ්ඨ
නියෝජ්‍ය
අධ්‍යක්ෂ

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ලංකා ප්‍රමිති කාර්යංශය යනුවෙන් ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලය 1984 අංක 06 දරණ පනත මගින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යන නාමය යටතේ ස්ථාපිත කරන ලදී.
ප්‍රධාන කාර්යාලය	No. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 8
දුරකථන	011-2671567-72, 2697039, 2674618
වෙබ් අඩවිය	http://www.slsi.lk
විද්‍යුත් තපෑල	slsi@slsi.lk
ෆැක්ස්	011 – 2687523, 2671579, 2672617, 2672616
2019-12-31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය	කේ අරුණු ප්‍රභා පෙරේරා මිය වැඩ බලන සභාපති ආචාර්ය සිද්ධිකා පී සේනාරත්න මිය නියෝජ්‍ය සභාපති/අධ්‍යක්ෂ ජනරාල්
2019-12-31 දිනට සම්පූර්ණ සේවක සංඛ්‍යාව	309
විගණකවරුන්	විගණකාධිපතිතුමා ජාතික විගණන කාර්යාලය අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල
බැංකුකරුවන්	ලංකා බැංකුව, අධිශ්‍රේණි ශාඛාව බොරැල්ල

මහා මණ්ඩල සමාජිකයින් - ශ්‍රීලංප්‍රඅා

එව් එම් බී සී හේරත් මයා
වැඩ බලන සභාපති 2019-01-02 දක්වා
B.Sc.(Botany), India., M.Sc.(Forestry)
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(a) and 7(1)

එම් එප් ජෙහාන් කාසීම් මයා
සභාපති 2019-02-07 සිට 2019-11-18 දක්වා
President Counsel, Attorney-at-Law
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(a) and 7(1)

කේ අරුනු ප්‍රභා පෙරේරා මයා
සභාපති තාවකාලික පත්වීම් 2019-12-06 සිට
Masters in Development Studies, Postgraduate
Diploma in Development Studies, Postgraduate
Diploma in Education, B.Sc. U'sity of Colombo.
Dip. in PA (SLIDA)

ආචාර්ය සිද්ධිකා පී සේනාරත්න මිය
අධ්‍යක්ෂ ජනරාල් / විධායක ප්‍රධාන විධායක නිලධාරී
BSc-Chem Sp (Hons), PhD (UK)
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6
OF 1984 SECTION : 6.1(I) and 7(2)

ආචාර්ය ජනිත ඒ ලියනගේ
මහා මණ්ඩල සාමාජික 2019-02-25 සිට 2019-11-30 දක්වා
Ph.D (Cardiff), C.C. Chem., F.I.Chem.C., FRSC.,
B.Sc Jayawardanapura
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION:6.1(g)

ඉංජිනේරු කේ එස් සිල්වා මයා
මහා මණ්ඩල සාමාජික 2019-02-25 සිට 2019-11-30 දක්වා
B.Sc. Eng. (Hons), M.Eng (structural), C.Eng.,
MIE (SL), MSSE (SL), DIPM(UK),
Chartered Eng., Green
Associated Professional –SLGBC
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(f)

ආචාර්ය ඒ එම් මුහාරක්
මහා මණ්ඩල සාමාජික 2019-02-25 සිට 2019-11-30 දක්වා
Doctor of Philosophy., Ph.D (Organic Chemistry).,
Bsc (Chemistry)
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1©

පී එස් එම් වාල්ස් මිය
මහා මණ්ඩල සාමාජික 2019-02-01 සිට 2019-11-30
Master in Disaster Management (Rajarata)
Master in Business Administration (Peradeniya)
MBA(Jaffna)
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(a)

සී ජේ කේ පෙරේරා
මහා මණ්ඩල සාමාජික 2019-02-25 සිට 2019-05-27 දක්වා
I.B.Com (Special), Chartered Accountancy Licentiate
Certificate
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(b)

බී කේ ආර් බාලසූරිය මයා
මහා මණ්ඩල සාමාජික 2019-06-07 සිට2019-11-30 දක්වා
M.A.(Econ.)., B.Com.(Sp.) (Hons)., Diploma in Public
Procurement and Contract Administration., CPFA., Higher
National Diploma in Accountancy
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(b)

කේ ඒ ඕ කුරුප්පු මයා
මහා මණ්ඩල සාමාජික 2019-03-19 සිට 2019-12-04 දක්වා
MA (Fin.Econ.).,APFA.,CASL (Inter.)
APPOINTED IN TERMS OF SLSI ACT NO.6
OF 1984 SECTION: 6.1(d)

එම් එච් කේ පරණවිතාන මයා
මහා මණ්ඩල සාමාජික 2019-02-25 සිට 2019-11-30 දක්වා
Attorney-at-Law.
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6
OF 1984 SECTION: 6.1(a)

කළමනාකරණ මඩුල්ල
ශ්‍රී ලං ප්‍ර ආ

එච් එම් බී සී හේරත් මහතා
වැඩබලන සභාපති 2019-01-02 **දක්වා**
B.Sc.(Botany), India., M.Sc.(Forestry)
Appointed in Terms of SLSI Act No.6
of 1984 Section 6.1(a) and 7 (1)

එම් එප් ජෙහාන් කාසිම් මයා
සභාපති
2098-02-07 **සිට** 2019-11-18
President Counsel, Attorney-at-Law

කේ අරුනු ප්‍රභා පෙරේරා මයා
සභාපති තාවකාලික පත්වීම් 2019-12-06 සිට
Masters in Development Studies, Postgraduate
Diploma in Development Studies, Postgraduate
Diploma in Education, B.Sc. U'sity of Col.
Dip. in PA (SLIDA)

ආචාර්ය සිද්ධිකා පී සේනාරත්න මිය
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිධාරීනී
2018-08-01 සිට
B Sc.-Chem. Sp. (Hons), PhD (UK)
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6

ඒ ඒකනායක මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2019-12-28 **දක්වා**
B.Sc. (Sp.), M.Sc.-Physics, ISO 9000 Lead Auditor, NQA Examiner

සමන්ති නාරන්ගොඩ මහත්මිය
අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂක)
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
MBA (Sri J-PIM), P G Dip in Mgt. B.Eng., MIET (UK),
QMS/EMS/OHSAS Auditor, NQA Examiner

මී එස් එස් ප්‍රනාන්දු මයා
අධ්‍යක්ෂ (ඉංජිනේරු ප්‍රමිති)
B.Sc. (Eng.) MBA, AMIE(SL),
QMS Lead Auditor (IRCA-UK)

එම් ඒ අලාම් මයා
අධ්‍යක්ෂ (පරිපාලන) (**කොන්ත්‍රාත් පදනම මත**)
2019/10/18 **සිට**
SLAS Special Grade

බී ඩී ආරියරත්න මහතා
අධ්‍යක්ෂ (ප්‍රලේඛණ හා තොරතුරු)
Director (Doc. & Information)
B.Sc.,(Special), M I P (SL)

එම් බී ඩී නීලකාන්ති මිය
අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ)
MBA, M.Sc., B.Sc.(Special) Hons.
QMS/EMS/EaMS/OHSAS Auditor,
Six Sigma(Green Belt) ASQ member

එල් පී එල් චිත්‍රගේ මහතා
අධ්‍යක්ෂ (පරීක්ෂණාගාර සේවා)
B.Sc. (Sp), M.Sc. C Phys, MIP (SL)

එස් උදාකර මෙනවිය
අධ්‍යක්ෂ (මිති විද්‍යා)
B.Sc (Sp),., M.Sc.(Physics of Materials) M I P (SL),
ISO17025 Technical Assessor, ISO9001 Auditor

එම් අයි එස් ජයසේකර මහත්මිය
අධ්‍යක්ෂ (විද්‍යාත්මක ප්‍රමිතිකරණ)
B.Sc. Special (Hons), M.Sc (Food Sc. & Tech)
Auditor : ISO 9001, QMS, ISO 22000 FSMS, HACCP,
GMP

ටී සේනාරත්න මිය
අධ්‍යක්ෂ (අලෙවි හා ප්‍රවර්ධන)
MBS, B.Sc.(Chem. Special), QMS Lead Auditor
(IRCA-UK)
Auditor for OHSAS & SA 8000, Examiner for NQA,
Certified Member (SLIM)

ඩබ්ලිව් ජී එම් එස් පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය)
Licentiate Certificate
The Institute of Chartered Accounts of Sri Lanka

ඩී බී එම් රාජසිංහ මිය
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (මුදල්)
අධ්‍යක්ෂ මුදල් තනතුරේ රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා පත්කිරීම 2019/06/03 දින දක්වා
Licentiate Certificate, The Institute of Chartered Accounts of Sri Lanka IPFDA

එම් එස් එම් අලියාර් මයා
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ භාණ්ඩ සහතිකකරණ තනතුරේ රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා පත්කිරීම
B.Sc. (Special), M.Sc., MIP (SL), SL NQA Examiner,
ISO9001, QMS Auditor

ඒ ඒ පී ඩී පිඟේරා මෙනවිය
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ පුහුණු තනතුරේ රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා පත්කිරීම 2019-01-01 දින දක්වා
B.Sc. (Gen) in Bio Science (Hons)
M.Sc. in Environmental Science

එම් එච් පී වීරසිංහ මයා
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ පුහුණු තනතුරේ රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා පත්කිරීම 2019-01-02 දින සිට
B.Sc., M.Sc., QMS Lead Auditor (IRCA-UK),
FSMS Auditor

හැඳින්වීම
2019 වර්ෂය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ශ්‍රීලංප්‍රඅා)1964 අංක 38 දරණ පනත යටතේ ලංකා ප්‍රමිති කාර්යාංශය ලෙස ස්ථාපිත කරන ලදී. 1984 අංක 6 දරණ පනත මගින් මෙම පනත අවලංගු කරන ලද අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ප්‍රමිතිකරණය සහ තත්ත්ව කළමනාකරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ මූලික වගකීම බලගන්වා ඇත

මෙම පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනයට පහත සඳහන් ප්‍රධාන අරමුණු පවරා ඇත.

- ජාතික හා ජාත්‍යන්තර පදනම්න් මත ප්‍රමිති සකස් කිරීම
- කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම.
- ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලනය තවදුරටත් කරගෙනයාම සඳහා රසායනාගාර, පුස්තකාල සහ වෙනත් අදාළ පහසුකම් ඇති කිරීම
- නිෂ්පාදිත, වෙළෙඳ භාණ්ඩ සහ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම මෙන්ම දේශීයව නිපදවන නිෂ්පාදනල වෙළඳ භාණ්ඩ හා ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිතා කරන ක්‍රියාවලි සහ පිළිවෙත් පිරික්සීම.
- පරීක්ෂාවන් සිදුකිරීම සහ ක්‍රමාංකනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හෝ පහසුකම් සැපයීම සහ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව වෙනත් උපකරණ සැපයීම
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා පහසුකම් සැපයීම හා සැලසුම් කිරීම
- සහතික ලාංඡන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- වෙළෙඳ භාණ්ඩ, ද්‍රව්‍ය හා වෙනත් නිෂ්පාදනවල ගුණාත්මක භාවය සහතික කිරීම.
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම.
- ආයතනයට සමගාමී අරමුණු තිබෙන ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම පුද්ගලයෙකු, සංගමයක් හෝ සංවිධානයක් සම සහයෝගයෙන් කටයුතු කිරීම.
- වෙළෙඳ භාණ්ඩ, ද්‍රව්‍ය සහ නිෂ්පාදන, ක්‍රියාවලි සහ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සඳහා නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින්ගේ උත්සාහයෙන් සම්බන්ධීකරණය කිරීම.

මානව සම්පත් හැඳින්වීම

2019 වර්ෂය ආරම්භයේ දී මුළු සේවක සංඛ්‍යාව 329 ක් වූ අතර වර්ෂය අවසානයේදී 309 ක් විය.

ආයතනය විසින් කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමේදී සඵලදායී ලෙස දායක වීම සඳහා ඔවුනගේ දැනුම සුපෝෂණය කිරීම් වස් සහාය ලබා දී ඇති අතර තවද, 2019 වර්ෂය තුළදී අවශ්‍ය තාක්ෂණික අදාල පුහුණුව ලබා දීමෙන් විධායක කාර්ය මණ්ඩල සේවකයින්ගේ තාක්ෂණික නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය විසින් පියවර ගෙන තිබේ.

2019 වර්ෂය තුළදී කර්මාන්ත හා වෙළදාම සඳහා ශ්‍රී ගංකා ප්‍රමිති ආයතන සිය සේවාවන් කාර්යක්ෂමව සඵලදායී ලෙස ලබාදීමෙන් ස්වයං පරියාප්ත තත්ත්වය පවත්වා ගැනීමට සමත්විය.

2019 වර්ෂය තුල උපයන ලද මුලු ආදායම LKR මිලියන 818.436 ක් වූ අතර 2018 දී LKR මිලියන 746,386 ක් විය.

මේ හේතුවෙන් LKR මිලියන 72,050 වැඩිවීමක් සිදු වී තිබේ. මෙම තත්ත්වය 2018 සිට 2019 වර්ෂය සඳහා එක් පුද්ගල ආදායම LKR මිලියන 2.2 සිට, LKR මිලියන 2.64 දක්වා වැඩි කර ගැනීමට හේතු විය.

වර්ෂයේ වැදගත් සිදුවීම් 2019

1 රටේ බලශක්ති පරිභෝජනය අවම කිරීමේ අරමුණින් ගෘහස්ථ යෙදුම්වල බලශක්ති කාර්යක්ෂම විදුලි උපකරණ ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු විය. මෙම බලපෑමේදී, CFL සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ ආලෝක විමෝචක ඩයෝඩ (LED) සඳහා අවම බලශක්ති කාර්ය සාධන සහතිකය සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

2 මිලිමීටර් 1400 ක ස්වීප් විෂ්කම්භයක් ඇති සිවිලිමේ විදුලි පංකා සඳහා බලශක්ති කාර්යක්ෂමතා ශ්‍රේණිගත කිරීම සාර්ථකව ක්‍රියාවට නංවා ඇත. බලශක්ති පරිභෝජනය අඩු කිරීමේ ක්‍රියාවලියට තවදුරටත් සහාය වීම සඳහා ශීතකරණ සඳහා අවම බලශක්ති කාර්ය සාධනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සකස් වෙමින් පවතී.

3 ජාතික ප්‍රමිතිකරණ උපායමාර්ග (DNSS) කෙටුම්පත සකස් කර ඇත.

4 සෞඛ්‍යය අමාත්‍යාංශය (ආහාර පාලන හා පරිපාලන ඒකකය) විසින් සම්බන්ධීකරණය කරන ලද CODEX හි ජාතික අනු කමිටු සාමාජිකයන් ලෙස සේවය කිරීමට පත් කර ඇත.

. CCCF සහ CCPR – ආහාර සහ පළිබෝධනාශක අපද්‍රව්‍යවල දූෂක පිළිබඳ උප කමිටුව.
· CCFA – ආහාර ආකලන පිළිබඳ උප කමිටුව.
· CCFH – ආහාර සනීපාරක්ෂාව පිළිබඳ උප කමිටුව.
· CCNFSDU – විශේෂ ආහාර භාවිතය සඳහා පෝෂණය සහ ආහාර පිළිබඳ අනු කමිටුව.
· CCRVDF – ආහාරවල පශු ඖෂධවල අවශේෂ පිළිබඳ උප කමිටුව.
· CCPL උප - ධාන්‍යය වර්ග සහ රනිල කුලයට අයත් බෝග පිළිබඳ කමිටුව.
· CCFFV සහ CCPFV- උප - නැවුම් පලතුරු සහ එළවළු පිළිබඳ කමිටුව සහ සැකසූ පලතුරු සහ එළවළු.
· CCFO අනු කමිටුව සහ තෙල්.
· CCSCH – කුළුබඩු සහ සූපශාස්ත්‍ර ඖෂධ පැළෑටි පිළිබඳ උප කමිටුව

5 UNIDO/ISO හි සහයෝගය සහ අනුග්‍රහය ඇතිව තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු සහභාගී විය.

· ISO TC 34 SC 8 ආහාර ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ තාක්ෂණික රැස්වීම (පූර්ණ රැස්වීම) 2019/07/06 සිට 2019/07/14 දක්වා ඉතාලියේ පැවැත්විණි.
· ISO TC 34 SC 12 2019/07/22 සිට 2019/07/28 දක්වා එක්සත් රාජධානියේ පැවති ආහාර නිෂ්පාදන පිළිබඳ සංවේදී විශ්ලේෂණය පිළිබඳ තාක්ෂණික රැස්වීම.
2019/05/21 සිට 2019/05/22 දක්වා ජර්මනියේ පැවති ධාන සහ ධාන්‍ය වර්ග පිළිබඳ ISO TC 34 SC 4 තාක්ෂණික රැස්වීම
· ESCAP/ISO/UNCTAD ගමනාගමන නොවන පියවර සහ තිරසාර සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ වැඩමුළුව තායිලන්තයේදී පැවැත්විණි.
· කර්මාන්තශාලා ආරක්ෂාව - තායිලන්තයේ පවත්වන ලද තෝරාගත් කෘෂි කාර්මික නිෂ්පාදනවල පසු අස්වනු සැකසීම සහ තත්ත්ව සහතික කිරීම
· ISO/TC 323 සහ ISO/DEVCO චක්‍රලේඛ ආර්ථිකය පිළිබඳ තාක්ෂණික කමිටු රැස්වීම ප්‍රංශයේදී පැවැත්විණි
· ISO/TC 34/SC 17 - 2019 කැනඩාවේ පැවති පූර්ණ හා ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්
· FSSC 22000 - නෙදර්ලන්තයේ පවත්වන ලද වාර්ෂික සුසංයෝග සමුළුව
· ISO/TC 217 හි 18 වන පූර්ණ රැස්වීම, විවිධ WGs සහ CAG රැස්වීම ස්විට්සර්ලන්තයේ පැවැත්විණි
· ISO/TC 6 කඩදාසි, පුවරු සහ පල්ප් රැස්වීම ඕස්ට්‍රේලියාවේ පැවැත්විණි

වර්ෂයේ වැදගත් සිදුවීම් 2019

6. කුරුඳු, ගම්මිරිස් සහ කෝපි පිළිබඳ හොඳ කෘෂිකාර්මික පිළිවෙත් සඳහා වන ශ්‍රී ලංකා සම්මත අවශ්‍යතා (GAP) කෙටුම්පත පිළිබඳ විශේෂ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

7. ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මධ්‍යම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (CPMU) සහාය ඇතිව,ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය (PDO) සමඟ එක්ව වි'ාන්විත සංචාර සඳහා ප්‍රමිතීන් සකස් කරන ලදී

8. UNIDO ව්‍යාපෘති - කුළුබඩු සහ සැකසූ ආහාර - කුඩා හා මධ්‍ය පරිමාණ විවසායක අංශය සඳහා සංවිධානය කර ඇති රැස්වීම් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් දායක වේ.

9. FAO - EU ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නවීකරණ වැඩසටහනට අදාළ උපදේශන වැඩමුළු සහ රැස්වීම් සඳහා ක්‍රියාකාරීව දායක විය.

10. සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු “ඉන්දියාවේ පැවති ප්‍රමිතිකරණය සහ අනුකූලතා තක්සේරුව පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට යටත් වූ අතර එය ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව (ITEC) විසින් අනුග්‍රහය දක්වන ලදී.

11. එක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (SDD) සහ අධ්‍යක්ෂ 2019-07-07 සිට 2019-07-17 දක්වා ඉන්දියාවේ පැවති මානව ආහාර සඳහා දකුණු ආසියාවේ සම්මත වැඩමුළුව සහ ආහාර සුරක්ෂිතතා වැළැක්වීමේ පාලන සන්ධානයේ නායක උපදේශක පාඨමාලාවට සහභාගී විය.

12. `ඉල්ලීම මත ශ්‍රී ලංකා ලංකා පොලිසිය සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කරන ලදී සම් සපත්තු සඳහා තාක්ෂණික පිරිවිතර සහ අනුකූලතාවය - PSS / PCC SL පොලිසිය ක්‍රීඩා කට්ටලය සඳහා තාක්ෂණික පිරිවිතර - ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය. ගෙල ටයි පටිය සඳහා තාක්ෂණික පිරිවිතර සහ අනුකූලතාවය - SL පොලිසිය තාක්ෂණික පිරිවිතර සහ බ්ලැන්කට්ටුව - S.L පොලිසිය

13. විදේශ රටවල නිෂ්පාදන සහතික කිරීම් සහ පද්ධති සහතික කිරීමේ විගණන සඳහා නිලධාරීන් සහභාගී විය.

14. FSSC 22000 සඳහා නව පද්ධති සහතික කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කර ඇත.

15. එක් අයදුම්පතක් ලැබීමෙන් නිරසාරව නිෂ්පාදනය කරන ලද ඉන්ධන දැව සහතිකය ආරම්භ කරන ලදී.

16. විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් GMP / Vidatha/ SLS නිෂ්පාදන/ පද්ධති සහතික කිරීමේ අවශ්‍යතා සහ විගණන ශිල්පීය ක්‍රම පිළිබඳව විද්‍යාතා නිලධාරීන් සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. GMP/Vidatha/SLS යෝජනා ක්‍රම සඳහා විගණකවරුන් තෝරා ගැනීම සඳහා විභාග පවත්වන ලදී.

17. BMICH සහ පොළොන්නරුවේදී පැවැත්වෙන ශිල්පසේන ප්‍රදර්ශනයේ - ශ්‍රී ලංකා තාක්ෂණ විප්ලවයේදී පුද්ගලීකරණය කළ වෛද්‍ය විද්‍යා යන තේමාව යටතේ තාක්ෂණික කලාපය සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම.

වර්ෂයේ වැදගත් සිදුවීම් 2019

18. 2019-03-25 දින BMICH හිදී සහභාගී වූවන් 250 දෙනෙකු සඳහා “ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සේවාවන් හරහා අපනයන විශිෂ්ටත්වය පිළිබඳ සම්මන්ත්‍රණය පවත්වන ලදී
”

19. පුද්ගලික අංශයේ ආයතන සඳහා "විවෘත දින වැඩසටහන" 2019-02-11 දින පවත්වන ලදී.

20. 2019-06-26 දින විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය සමඟ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සේවාදායකයින් දෙනෙකු සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
200

21. 2017 සහ 2018 ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සම්මානය පිළිබඳ සම්මාන උළෙල පවත්වන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ අතිගරු ජනාධිපතිතුමා

22. ප්‍රමිතිකරණයේ ප්‍රතිලාභ ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩමුළු සහ ප්‍රමිති ප්‍රවර්ධන වැඩසටහන් 62ක් පවත්වන ලදී.

23. “ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සේවාවන්හි ප්‍රතිලාභ” පිළිබඳව විශ්වවිද්‍යාල සහ පාසල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

24. ප්‍රජාවේ ගුණාත්මක ජීවිතය නඟා සිටුවීම සඳහා ගුණාත්මක, ප්‍රමිතිවල ප්‍රතිලාභ සහ පද්ධති සහතික කිරීමේ යෝජනා ක්‍රම පිළිබඳ සුදුසු මාධ්‍ය භාවිතා කරමින් පාරිභෝගික දැනුවත් කිරීම බෙදා හැරීම (මාධ්‍ය වැඩසටහන් 21)

25. SLSI විසින් සපයනු ලබන සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ හා අධ්‍යාපනික ප්‍රදර්ශණ 48 කට සහභාගී විය.

26. කළමනාකරණ පද්ධති පිළිබඳ පුහුණු වැඩසටහන - මොරටුව විශ්වවිද්යාලය, ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දින 05) සහ ශ්‍රීලංකා තේ මණ්ඩලය සඳහා HACCP/ISO 22000:2018 පිළිබඳ විගණක පුහුණු වැඩසටහන ද පවත්වන ලදී.

27. ප්‍රතීතන විෂය පථය 2019 දී පරිමාව, පීඩනය සහ බලය යන ක්ෂේත්‍රවල පුළුල් කරන ලදී. තවද ISO : IEC 17025 : 2017 සංක්‍රාන්තිය 2019 දී මිනුම් විද්‍යා අංශය විසින් සිදු කර ඇත.

28. රටේ කාලෝචිත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් තම පාරිභෝගිකයන් වෙත සේවාවන් පුළුල් කිරීමේ අරමුණින් රසායනාගාරයේ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.





වර්ෂයේ වැදගත් සිදුවීම් 2019

අ) පළතුරු සහ එළවළු, ජලය, කුළුබඩු සහ තේවල පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.



ආ) ඉතා පහළ මට්ටමේ ආහාරවල මූලද්‍රව්‍යය විශ්ලේෂණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී (සහල්, නූඩ්ල්ස්, ටින් මාළු, උකු කිරි, පොල් කිරි, ලුණු,



ආදිය), ජලය, විලවුන්, පොහොර



ඇ) සිවිලිං විදුලි පංකාවල බලශක්ති කාර්යක්ෂමතාව මැනීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර පරීක්ෂණ ආරම්භ කරන ලදී.



d) A Adaptors 13 සහ A Trailer sockets 13 සඳහා පරීක්ෂණ ධාරිතාව වර්ධනය කිරීම.

29. ගැසට් අංක 2048/38 12 හි ප්‍රකාශයට පත් කර ඇති පාරිභෝගික කටයුතු අධිකාරියේ රෙගුලාසිවලට අනුකූලතාව තක්සේරු කරමින් අනාරක්ෂිත සොකට් සහ පේනු ආනයනය පාලනය ශක්තිමත් කිරීම සම්බන්ධව තත්ත්ව ආරක්ෂණ අංශය ක්‍රියා කරයි

30 නව 5'S පෝස්ටර් නිර්මාණය කරන ලදී



ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්
2019

2001 වසරේ හඳුන්වා දුන් SLSI හි ආදායම් උත්පාදනය සඳහා වූ ක්‍රියාවලිය 2019 වර්ෂ යේදී ද අඛණ්ඩව සිදු කරන ලද අතර, රුපියල් මිලියන 818,436 ක ආදායමක් වාර්තා කළේය. මෙය ස්වයංපරියාප්ත තත්ත්වය පවත්වා ගැනීමට මග පාදමින් ආදායම් මාර්ගයක් ලෙස රජයේ ප්‍රදාන මත යැපීම නොකරමින් ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 72,070 කින් අභිබවා ගොස් ඇත.

ආයතනය විසින් උත්පාදනය කරන ලද ආදායම (වසර සඳහා අය වැය කළ රුපියල් මිලියන 695,800 ට සාපේක්ෂව මුළු රුපියල් මිලියන 818,436) පහත ක්‍රියාකාරකම් ක්ෂේත්‍රවලින් ලබා ගන්නා ලදී. ඒවා සංසන්දනය කිරීම සඳහා 2018 වර්ෂය සඳහා වන සංඛ්‍යා සමඟ පහත වගුවේදක්වා ඇත.

ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය	2018 (LKR'000)	2019 (LKR'000)
ආනයන පරීක්ෂණ ක්‍රියාකාරකම්	206,701	223,816
නිෂ්පාදන සහතික කිරීම, ධීවර (fishery) පරීක්ෂාව බෝතල් කළ පානීය ජලය ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු	190,901 794	.218,072 180
පද්ධති සහතික කිරීමේ ක්‍රියාකාරකම්	80,992	80,360
රසායනාගාර පරීක්ෂණ සහ ක්‍රමාංකනය	201,286	229,981
සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන්	47.497	45,906
ප්‍රමිති අලෙවිය සහ වෙනත් තොරතුරු සැපයීම	14.484	15,028
වෙනත්	3.711	5,093
	746.386	**818,436**

** ඉහත සියලුම සංඛ්‍යා පොලී ආදායම හැර 2019 වර්ෂයේ දී සම්පූර්ණ පොලී ආදායම වශයෙන් LKR 66,453,633/ ක් ලැබ ඇත

2018 වසරේ මෙන්, 2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් යන දෙකම ආවරණය කිරීම සඳහා SLSI විසින් භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබාගෙන නොමැත.

2019 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා සමඟ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

	2018 රු. මිලියන	2019 රු. මිලියන
පුනරාවර්තන වියදම්	674,848	775,117
ප්‍රාග්ධන වියදම්	62,150	103,531

විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) ප්‍රධාන අරමුණ වන්නේ නිෂ්පාදන, භාවිතයන්, ද්‍රව්‍ය, ව්‍යුහයන්, භාණ්ඩ, මෙහෙයුම් සහ කළමනාකරණ පද්ධති සම්බන්ධ ජාත්‍යන්තර මාර්ගෝපදේශ මත පදනම්ව ජාතික ප්‍රමිති සැකසීමයි. කර්මාන්ත හා වාණිජ්‍යය තුළ SLSI ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කරයි. විවිධ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ප්‍රමිති භාවිතය ප්‍රවර්ධනය කිරීම තුළින් SLSI ප්‍රමිති භාවිතා කරයි. රටේ වෙනත් බොහෝ සංවිධාන සහ උනන්දුවක් දක්වන පාර්ශව විසින් ප්‍රමිති භාවිතා කරනු ලැබේ. මේ වන විට ආයතනය විසින් ප්‍රමිති 4200ක් පමණ ප්‍රකාශයට පත් කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිති විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය විසින් සම්පාදනය කරනු ලබන්නේ පාරිභෝගිකයින්, නිෂ්පාදකයින්, පරිශීලකයින්, රාජ්‍ය ආයතන සහ ස්වාධීන තාක්ෂණික සංවිධාන ආදිය නියෝජනය කරන සියලුම උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ ස්වේච්ඡා මැදිහත්වීම සහ සමුපකාර ප්‍රයත්නය ඇතිව සහභාගීත්ව, විනිවිද පෙනෙන සහ උපදේශන ක්‍රියාවලියක් මගිනි. සීමිත සම්පත් සමඟ කළමනාකරණය කිරීම සඳහා යෝජනා අතර ප්‍රමුඛතා හඳුනා ගනිමින් ජාතික ප්‍රමිතීන් සැකසීම/වර්ධනය කිරීම සිදු කරයි.

ආහාර, කෘෂිකර්මය, රසායනික, රූපලාවන්‍ය, පොලිමර්, ඇසුරුම්, කඩදාසි, පුවරු, රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්, පාවහන්, සම් ආශ්‍රිත නිෂ්පාදන සහ කළමනාකරණ පද්ධති වැනි විෂය ක්ෂේත්‍ර සඳහා ජාතික ප්‍රමිතීන් එම අංශය විසින් සකස් කරනු ලැබේ. මෙම ප්‍රමිතීන් පිරිවිතර, පරීක්ෂණ ක්‍රම, පරිචයන් සංග්‍රහය, පදමාලා සහ නියමයන්, සංකේත, කළමනාකරණ පද්ධති යනාදී වශයෙන් වර්ග කළ හැක. ශ්‍රී ලංකා ප්‍රමිතීන් සම්පාදනය සඳහා අධිකාරීන් ඇතුළු පෞද්ගලික සහ රාජ්‍ය අංශ නියෝජනය කරන විවිධ පාර්ශවයන්ගෙන් SLSI වෙත යෝජනා ලැබේ. මෙම අංශය ප්‍රමිති සැකසීමේ ක්‍රියාකාරකම් සඳහා ISO මාර්ගෝපදේශ සහ අනෙකුත් ස්ථාපිත මාර්ගෝපදේශ අනුගමනය කරයි.

ISO 9001 හි අවශ්‍යතා අනුව මෙම අංශය ලේඛනගත තත්ත්ව කළමනාකරණ පද්ධතියක් (QMS) පවත්වාගෙන යයි. ක්‍රියා පිළිවෙත්, මාර්ගෝපදේශ, ආකෘති අඛණ්ඩව වැඩිදියුණු කිරීමත් සමඟ භාවිතා කර පවත්වාගෙන යයි.

SLSI මහා මණ්ඩලය විසින් කෘෂිකර්මය පිළිබඳ ආංශික කමිටුව, ආහාර නිෂ්පාදන පිළිබඳ ආංශික කමිටුව, රසායනික හා බහු අවයවක තාක්ෂණය පිළිබඳ ආංශික කමිටුව, කඩදාසි, පුවරු සහ ඇසුරුම් පිළිබඳ ආංශික කමිටුව, රෙදිපිළි හා ඇඳුම් පිළිබඳ ආංශික කමිටුව, සම් සහ සම්භාණ්ඩ පිළිබඳ ආංශික කමිටුව යන ආංශික කමිටු 06ක් පත් කර ඇත.

ආංශික කමිටු වල මගපෙන්වීම ඇතිව, අංශය විසින් ක්‍රියාකාරී කණ්ඩායම් (Working groups) පත් කර සියලු තොරතුරු සහ තාක්ෂණික දත්ත එක්රැස් කර පසුව සම්මුතිය හරහා අවශ්‍යතා/ පරාමිතීන් තීරණය කර හැකි උපරිම ආකාරයෙන් විශේෂඥ දැනුමෙන් සම්මුතියක් ඇති කර ගන්නා ලදී. අංශයේ නිලධාරීන් ක්‍රියාකාරී කණ්ඩායම් සහ ආංශික කමිටු සඳහා තාක්ෂණික ලේකම්වරුන් ලෙස සේවය කළහ. කාර්යයක් පැවරූ පසු නිලධාරීන් සාහිත්‍ය සමීක්ෂණයක් කරයි. අදාළ ප්‍රමිතියේ මූලික කෙටුම්පත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ (අංශ ප්‍රධානීන්) අධීක්ෂණය යටතේ සහකාර අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරයි. මූලික කෙටුම්පත (පළමු කෙටුම්පත) ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයින් අතර බෙදාහරින ලද අතර වරින් වර සාමාජිකයින් ප්‍රතිපත්ති ප්‍රකාශන ආයතනයේදී හමුවී සාකච්ඡා කරයි. ප්‍රමිති සංවර්ධන ක්‍රියාවලියේ මහජන අදහස් දැක්වීමේ අදියරේ දී, සංවර්ධිත කෙටුම්පත් ප්‍රමිතීන් සඳහා මහජනතාවගෙන් අදහස් ලබා ගන්නා ලදී. සෑම කෙටුම්පත් ප්‍රමිතියක් සඳහාම මහජන සංසරණ කාලය සාමාන්‍යයෙන් මාස දෙකකි. පොදු මහජනතාව ආරක්ෂා කරමින් ජාතික ආර්ථිකයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා අවසන් කෙටුම්පත සකස් කිරීම සඳහා මහජන අදහස් කාලය තුළ ලැබුණු අදහස් සලකා බලන ලදී. WTO/TBT ගිවිසුම යටතේ, හැකි සෑම විටම ජාත්‍යන්තර ප්‍රමිතීන් මත ජාතික ප්‍රමිති පදනම් කිරීමට ශ්‍රී ලංකාවට බැඳීමක් ඇත. එබැවින්, ජාතික ප්‍රමිති සැකසීමේදී, SLSI හි ප්‍රතිපත්තිය වන්නේ හැකිතාක් දුරට ජාත්‍යන්තර ප්‍රමිති සහ භාවිතයන්ට අනුකූල වීමයි. ශ්‍රී ලංකා ප්‍රමිති සම්පාදනය කිරීමේදී පිටපත් හිමිකම් අවශ්‍යතාවලට යටත්ව මූලාශ්‍ර ලේඛන ලෙස විදේශ ප්‍රමිති බොහෝ දුරට භාවිතා වේ. ISO සහ IEC ප්‍රමිති ශ්‍රී ලංකා ප්‍රමිති ලෙස සම්මත කර ගැනීමට SLSI හි ප්‍රමිති සැකසීමේ අංශවලට අයිතිය ඇත. ඇතැම් අවස්ථාවලදී, අවශ්‍ය නම් වෙනස් කිරීම්වලට යටත්ව, ඔවුන්ගේ ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා SLSI විසින් SARSO, CODEX වැනි අනෙකුත් කලාපීය සහ ජාත්‍යන්තර ප්‍රමිති ආයතන සමඟ ගිවිසුම් ඇති කර ගෙන ඇත.

සකස් කරන ලද සියලුම කෙටුම්පත් ප්‍රමිති සහ සම්මත කරන ලද ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීමට අවසර ඇත්තේ අදාළ ආංශික කමිටු විසින් අනුමත කිරීමෙන් පසුව SLSI මහා මණ්ඩලයේ අවසාන අවසරයෙන් පසුව පමණි. සාමාන්‍යයෙන් මහා මණ්ඩලයේ රැස්වීම් මසකට වරක් පවත්වනු ලැබේ. 2019 වර්ෂයේ අවසන් මාස දෙක තුළ සභා රැස්වීම පැවැත්වුණේ නැත. මුද්‍රිත ප්‍රමිතීන් ප්‍රලේඛන සහ තොරතුරු අංශයෙන් (SLSI පුස්තකාලය) මිලදී ගැනීමට හැකිය. වැඩි විස්තර සඳහා සාමාන්‍ය ජනතාවට SLSI වෙබ් පිටුව (www.slsi.lk) නැරඹිය හැකිය. .

2019 වර්ෂය තුළ, අංශය විසින් නව ශ්‍රී ලංකා ප්‍රමිති එකසිය විසිතුනක් (123) සකස් කරන ලදී. එකසිය හතර (104) ජාත්‍යන්තර (ISO,IEC) ප්‍රමිතීන්ගේ නව සම්මත කිරීම් විය. ප්‍රමිතීන් තිස් පහ (35) සංශෝධනය කරන ලදී. සංශෝධනයක් හෝ සංශෝධනයක් අවශ්‍යද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමිතීන් හැත්තෑ දෙක (72) සමාලෝචනය කරන ලදී. ප්‍රමිති හතරක් (04) නැවත තහවුරු කරන ලදී. සංශෝධන හයක් (06) නිකුත් කරන ලද අතර ප්‍රමිති නවයක් (09) ඉල්ලා අස්කර ගන්නා ලදී. ප්‍රමිතීන් හතරක් (04) අහිබවා ගියේය. 2019 දෙසැම්බර් 31 වැනි දිනට කෙටුම්පත් ප්‍රමිති දහනවයක් (19) සහ සංශෝධන කෙටුම්පත් හතක් (07) මහජන අදහස් දැක්වීමේ අදියර දක්වා ප්‍රගතියට පත් විය. කවුන්සිලයේ කෙටුම්පත් අදියර දක්වා ඉහත සඳහන් කළ ප්‍රමිතිවල අනුපාතය සංවර්ධනය කරන ලදී.



ඉහත ප්‍රතිඵලය වූයේ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම් අසූපහක (85) ආංශික කාරක සභා රැස්වීම් දහතුනක (13) අතිරේක විශේෂ රැස්වීම් දහයක (10) සහ ජාතික කැඩපත් කමිටු රැස්වීම් හතරක (04) ප්‍රතිඵලයකි.

ජාත්‍යන්තර ප්‍රමිතිකරණ

ISO (ප්‍රමිතිකරණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය)

බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයින් ISO තාක්ෂණික කමිටු (TCs) හි සහභාගීත්ව හෝ නිරීක්ෂක සාමාජිකත්වය දරන අතර ISO ප්‍රමිතීන් කෙටුම්පත් කිරීමේදී ඡන්දය ප්‍රකාශ කරමින් සහ අදහස් දක්වමින් ජාත්‍යන්තර ප්‍රමිති සැකසීම සඳහා සහභාගී වේ.

UNIDO හි සහයෝගය සහ අනුග්‍රහය ඇතිව තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා නිලධාරීන් තිදෙනෙකු සහභාගී විය.

ISO TC 34 SC 8 2019/07/06 සිට 2019/07/14 දක්වා ඉතාලියේ පැවති ආහාර ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ තාක්ෂණික රැස්වීම (පූර්ණ රැස්වීම).

ISO TC 34 SC 12 2019/07/22 සිට 2019/07/28 දක්වා එක්සත් රාජධානියේ පැවති ආහාර නිෂ්පාදන පිළිබඳ සංවේදී විශ්ලේෂණය පිළිබඳ තාක්ෂණික රැස්වීම.

2019/05/21 සිට 2019/05/22 දක්වා ජර්මනියේ පැවති ධාන්‍ය සහ ධාන්‍ය වර්ග පිළිබඳ ISO TC 34 SC 4 තාක්ෂණික රැස්වීම

මේ පිළිබඳ ජාතික ප්‍රමිතිකරණ උපායමාර්ග (DNSS) කෙටුම්පත සකස් කර ඇත. සිංගප්පූරුවේ පැවති වැඩමුළුවකට එක් නිලධාරියෙක් සහභාගී විය.

කෝඩෙක්ස් අලිමැන්ටරියස් කොමිසම

අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (ආහාර අංශය සහ කෘෂිකර්ම අංශය) සහ සහකාර අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකු පහත ජාතික කෝඩෙක්ස් අනු කමිටුවල සේවය කර ඇත

CCCF සහ CCPR - ආහාර සහ පළිබෝධනාශක අපද්‍රව්‍යවල දූෂක පිළිබඳ උප කමිටුව.
CCFA - ආහාර ආකලන පිළිබඳ උප කමිටුව.
CCFH - ආහාර සනීපාරක්ෂාව පිළිබඳ උප කමිටුව.
CCNFSDU - විශේෂ ආහාර භාවිතය සඳහා පෝෂණය සහ ආහාර පිළිබඳ අනු කමිටුව.
CCRVDF - ආහාරවල පශු ඖෂධවල අවශේෂ පිළිබඳ උප කමිටුව.
CCPL උප - ධාන්‍ය ධාන්‍ය වර්ග සහ රනිල කුලයට අයත් බෝග පිළිබඳ කමිටුව.
CCFFV සහ CCPFV- උප -නැවුම් පලතුරු සහ එළවළු සහ සැකසූ පලතුරු සහ එළවළු පිළිබඳ කමිටුව.
CCFO අනු කමිටුව - මේද සහ තෙල්.
CCSCH - කුළුබඩු සහ සූපශාස්ත්‍ර ඖෂධ පැළෑටි පිළිබඳ උප කමිටුවCCSCH - කුළුබඩු සහ සූපශාස්ත්‍ර ඖෂධ පැළෑටි පිළිබඳ උප කමිටුව කලාපීය ප්‍රමිතිකරණ වැඩ

කලාපීය ප්‍රමිතිකරණ කටයුතු

SARSO (දකුණු ආසියානු කලාපීය ප්‍රමිතිකරණ සංවිධානය)

SARSO යනු SAARC හි විශේෂිත ආයතනයක් වන අතර, SAARC කලාපයේ ප්‍රමිතිකරණය සහ ප්‍රමිති සමීකරණය සමඟ කටයුතු කරයි. SARSO හි සාමාජික ආයතන SAARC රටවල් අටේ ජාතික ප්‍රමිති ආයතන (NSBs) වේ. SLSI යනු SARSO සඳහා ශ්‍රී ලංකාවේ සාමාජික ආයතනයයි.

අංශයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය, SARSO හි ව්‍යාපෘති හැත්තෑ හතර (74) ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන් ලෙස සේවය කිරීම තුළින් ක්‍රියාකාරකම්වලට සක්‍රීයව සම්බන්ධ වේ. 2019 වර්ෂයේදී SARSO විසින් තාක්ෂණික රැස්වීම් සංවිධානය කර නොතිබුණි. එම නිසා තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා නිලධාරීන් සහභාගී නොවීය.

අංශයේ අනෙකුත් ක්‍රියාකාරීන්

කුරුඳු, ගම්මිරිස් සහ කෝපි සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති අවශ්‍යතා (GAP) කෙටුම්පත පිළිබඳ විශේෂ සම්මන්ත්‍රණයක් එම අංශය විසින් සංවිධානය කරන ලදී. එය 2019-08-22 දින පවත්වන ලද අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි.

අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 2019-07-18 සිට 2019-07-21 (දින 04) සහ 2019-09-25 සිට 2019-09-29 දක්වා පොළොන්නරුවේදී කොළඹදී (BMICH) පැවැත්වූ විද්‍යා තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ “ශිල්පසේන” ප්‍රදර්ශන සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත.

කෘෂිකර්ම අංශයේ අධ්‍යක්ෂ 2019-06-25 දින ජාතික කාබනික පාලන ඒකකය (NOCU) පිළිබඳ 2 වන උපදේශක කමිටු රැස්වීමට සහභාගී විය.

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මධ්‍යම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (CPMU) සහාය ඇතිව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය (PDO) වික්‍රමාන්විත සංචාරක අංශය සඳහා ප්‍රමිතීන් සංවර්ධනය කරන ලදී.

UNIDO ව්‍යාපෘති - කුළුබඩු සහ සැකසූ ආහාර - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සඳහා සංවිධානය කර ඇති රැස්වීම් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය තුළින් දායක වේ.

FAO - EU ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නවීකරණ වැඩසටහනට අදාළ උපදේශන වැඩමුළු සහ රැස්වීම් සඳහා ක්‍රියාකාරීව දායක විය.

අනෙකුත් අංශ වෙත සේවා

SLSI හි අනෙකුත් අංශවලට සහාය වීම සඳහා කාර්ය මණ්ඩලය සම්පත් දායකයින්, විගණකවරුන්, තක්සේරුකරුවන් යනාදී වශයෙන් සේවය කළහ.

ISO 9001, ISO 22000, ISO 14000, OHSAS පිළිබඳ විගණක සුදුසුකම් ඇති කාර්ය මණ්ඩලය විසින් මිනිස් දින 200 ක් වැය කරන ලද අතර පද්ධති සහතික කිරීමේ අංශය සහ නිෂ්පාදන සහතික කිරීමේ අංශය විසින් සංවිධානය කරන ලද විගණන සිදු කිරීම සඳහා GMP පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ඇත. තත්ත්ව සහතික අංශය විසින් සකස් කරන ලද ටින් මාළුවල සංවේදී ගුණාත්මක බව ඇගයීම සඳහා ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයින් තක්සේරුකරුවන් ලෙස කටයුතු කළහ. පුහුණු අංශයේ සම්පත් දායකයින් ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් මිනිස් පැය 50 ක පමණ කාලයක් කථිකාචාර්යවරුන් විසින් භාර ගන්නා ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් අනෙකුත් අංශ විසින් සංවිධානය කරන ලද රැස්වීම් ප්‍රදර්ශන සඳහා සහභාගී වූ අතර 2019 වර්ෂයේ අවස්ථා දෙකක් සඳහා ජාතික තත්ත්ව සම්මාන වැඩසටහන සඳහා ආයතන ඇගයීමේ දී ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරීන් විසින් සේවා සපයන ලදී.

බාහිර සංවිධාන සඳහා සේවා

අපනයන සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණික උපදේශක කමිටු, ශ්‍රී ලංකා යුද හමුදාව, විශේෂ කාර්ය බළකාය, ශ්‍රී ලංකා පොලිසිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික කෝඩෙක්ස් කමිටු, NMRA වැනි අනෙකුත් සංවිධානවල රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී වීමෙන් අංශයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය අනෙකුත් සංවිධාන සඳහා සේවය කළහ. (ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය) ජාතික පොහොර ලේකම් කාර්යාලය, කුළුබඩු කවුන්සිලය මෙන්ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී, ආදිය. සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද TBT සහ SPS පිළිබඳ ජාතික අනු කමිටු සාමාජිකයින් ලෙස ද සහභාගී විය.

කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය (විදේශීය පුහුණුව/විගණනය)

සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් "ඉන්දියාවේ පැවති ප්‍රමිතිකරණය සහ අනුකූලතා තක්සේරුව පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනක් භාරගත් අතර එය ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව (ITEC) විසින් අනුග්‍රහය දක්වන ලදී.

අධ්‍යක්ෂවරයා සහ එක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරවරයෙක් (SDD) දකුණු ආසියා වැඩමුළුවට සහ ආහාර සුරක්ෂිතතා වැළැක්වීමේ පාලන සන්ධානයේ ප්‍රධාන උපදේශක පාඨමාලාව සඳහා 2019-07-07 සිට 2019-07-17 දක්වා ඉන්දියාවේදී සහභාගී විය.

අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් පහත සඳහන් විදේශීය විගණන සඳහා සහභාගී වූහ.

- 2019-03-13 සිට 2019-03-17 දක්වා ෆිජි හි ෆිජි ඩෙයරි ලිමිටඩ් හි පද්ධති සහතික කිරීමේ විගණනය.

- 2019-06-02 සිට 2019-06-09 දක්වා චීනයේ ශැන්සු ටොන්ග්ෆා ඉන්ඩස්ට්‍රීස් ෆැන්ටසි බේකර්ස් හි හි ආනයන පරීක්ෂණ ලියාපදිංචි විගණනය.

- 2019-04-20 සිට 2019-04-25 දක්වා චීනයේ ෂිගි හුආබො මින්සිඇං හි ආහාර ද්‍රව්‍ය පිළිබඳ විගණනයක්.

-2019-08-04 සිට 2019-08-09 දක්වා මාල දිවයිනේ ෆැන්ටසි බේකර්ස් (Pvt) ෆැන්ටසි බේකර්ස් හි ආහාර සුරක්ෂිතතා පද්ධති සහතික කිරීමේ විගණනය.

-2019-11-23 සිට 2019-11-30 දක්වා නවසීලන්තයේ සීමාසහිත විවෘත රට කිරිපිටි පූර්ණ ක්‍රීම් කිරිපිටි කම්හල්වල සහ 2019-12-02 සිට 2019-12-06 දක්වා වේ අවමුතු සහ ලිචිෆීල්ඩ් කම්හල්වල නිෂ්පාදන සහතික කිරීමේ විගණන,



ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය

නොරතුරු තාක්ෂණය, විදුලි උපකරණ සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම්, ගොඩනැගිලි නඩත්තු කිරීම් සහ වැඩමුළු ක්‍රියාකාරකම් ඇතුළු සියලුම ඉංජිනේරු විෂයයන් සඳහා ජාතික ප්‍රමිති සකස් කිරීම හා යාවත්කාලීන කිරීම ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය සතු වගකීම වේ.

සමාලෝචිත වර්ෂය තුළ නව ශ්‍රී ලංකා ප්‍රමිති දහතුනක් (13) සම්පාදනය කරන ලද අතර, ප්‍රමිති පහක් (05) සංශෝධනය කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිතීන් පහළොවක් (15) ජාතික ප්‍රමිති ලෙස ප්‍රතිග්‍රහනය (adoptions) කරන ලදී. පවත්නා ප්‍රමිතීන්ට සංශෝධන හතක් (07) නිකුත් කරන ලදී. මෙම ප්‍රමිතීන් සකස් කිරීම සඳහා ආංශික කමිටු රැස්වීම් තිස්පහක් (35) සහ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් විසි හතක් (27) පවත්වන ලදී. ඉංජිනේරු අංශය අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ අඛණ්ඩව කටයුතු කළ අතර ප්‍රමිති සම්පාදනය සඳහා වූ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම්වලට සහභාගී විය.

නිෂ්පාදන සහතික කිරීමේ (SLS scheme) කටයුතු සඳහා විගණකවරුන් ලෙස සහභාගී වීමෙන් (SLS) නිෂ්පාදන සහතික කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මෙම අංශයේ ඉංජිනේරුවන් දායක විය.

ගෘහස්ථ යෙදීම්වල බලශක්ති කාර්යක්ෂම විදුලි උපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. සංයුක්ත ප්‍රතිදීප්ත පහන් (CFL) සඳහා නව සහතික අටක් (08) සහ නැවත සහතික කිරීම් හතලිස් තුනක් (43) ඇතුළුව බලශක්ති කාර්යක්ෂමතා සහතික පනස්එකක් (51) නිකුත් කරන ලදී. ආලෝක විමෝචක දියෝඩ (LED) සඳහා අවම බලශක්ති කාර්ය සාධන සහතික සියයක් (100) නිකුත් කරන ලදී. විදුලි පංකා සඳහා බලශක්ති කාර්යසාධක සහතික නවයක් (09)නිකුත් කරන ලදී.

ප්‍රමිති සංවර්ධනය සහ අදාළ කටයුතු වෙනත් සංවිධාන සමඟ

පහත සඳහන් ප්‍රමිති සංවර්ධනය කිරීම සහ අනෙකුත් කටයුතු පෙන්වා දෙන ලද ආයතනවල සහාය ඇතිව අඛණ්ඩව සිදු කරන ලදී.

1 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමඟ විදුලි උපකරණ සඳහා බලශක්ති කාර්යක්ෂමතා ශ්‍රේණිගත කිරීමේ ප්‍රමිතීන්.

2 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමඟ LED සහ සිවිලිම් විදුලි පංකා සඳහා අවම බලශක්ති කාර්ය සාධන යෝජනා ක්‍රමය (MEPS) ක්‍රියාත්මක කිරීම

ඉහත ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව, අංශය විසින් බාහිර ආයතන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනෙකුත් අංශ සඳහා උපදේශන සේවා සපයන ලදී. ශ්‍රී ලං ප්‍ර ආ ඇතුළු රාජ්‍ය ආයතනවල රජයේ ටෙන්ඩර් ක්‍රියාවලියට සහාය වීම සඳහා මෙම අංශයේ ඉංජිනේරුවන් තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සහ ප්‍රසම්පාදන කමිටු (PC) කිහිපයක සේවය කළහ.

ශ්‍රී ලං ප්‍ර ආ විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස මෙම අංශයේ ඉංජිනේරුවන් කටයුතු කළ අතර තත්ත්ව කළමනාකරණ පද්ධතිය (ISO 9001), පාරිසරික කළමනාකරණ පද්ධතිය (ISO 14001), වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (OHSAS 18001), බලශක්ති කළමනාකරණ පද්ධතිය (ISO 50001) සඳහා විගණකවරුන් ලෙස සහ ජාතික තත්ත්ව සම්මාන උළෙල සඳහා ඇගයීම්කරුවන් ලෙසද සහභාගී වූහ.

ආ) ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

සමාලෝචිත වර්ෂය තුළදී, අංශය විසින් වැඩමුළුව ඇතුළු වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා සහ ඉදිකිරීම් කටයුතු සඳහා අංශයේ ඉංජිනේරුවන්ගේ සහාය ඇතිව අඛණ්ඩව සේවාවන් සැපයීම සිදු කරන ලදී.

ඇ) වාහන නඩත්තු කිරීම

අංශය විසින් වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

පද්ධති සහතිකකරණ අංශය

SLSI හි පද්ධති සහතිකකරණ අංශය දැනට පහත පරිදි කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රම දහතුනක් (13) ක්‍රියාත්මක කරයි.

- ISO 9001 තත්ත්ව කළමනාකරණ පද්ධතිය
- ISO 14001 පාරිසරික කළමනාකරණ පද්ධතිය
- ISO 22000 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය
- HACCP උපද්‍රව විශ්ලේෂක අවදානම් පාලක ලක්ෂ්‍ය සහතිකකරණ ක්‍රමය
- OHSAS 18001 / ISO 45001 වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය
- GMP යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතික කිරීමේ ක්‍රමය
- සුපිරි වෙළඳපල සහතික කිරීමේ ක්‍රමය
- කාබනික නිෂ්පාදන සහතික කිරීමේ (Organic Certification) ක්‍රමය
- ISO 50001 බලශක්ති කළමනාකරණ පද්ධතිය
- ආහාර සහ බීම සඳහා නිර්මාංශ පද්ධති සහතික කිරීමේ ක්‍රමය
- විදානා පද්ධති සහතික කිරීමේ ක්‍රමය
- හරිතාගාර වායු සත්‍යාපනය සහ ප්‍රමාණකරණය
- තිරසාරව නිපදවන ඉන්ධන දැව සහතික කිරීම

2019 වසර තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) සහ RvA නෙදර්ලන්තය වෙතින් QMS, FSMS, HACCP සහ EMS සඳහා ලත් ප්‍රතීතන තත්ත්වය පවත්වා ගැනීමට පද්ධති සහතිකකරණ අංශයට හැකි විය.

ISO 9001 : 2015 තත්ත්ව පද්ධති සහතිකකරණ ක්‍රමය

2019 වර්ෂය තුළ ISO 9001 සහතිකකරණ ක්‍රමය සඳහා අයදුම්පත් 29 ක් ලැබුණු අතර, ප්‍රමාණවත් විගණන 29 ක්, 1 වන අදියර විගණන 19 ක්, 2 වන අදියර විගණන 39 ක්, පසු විපරම් විගණන 233 ක් සහ නැවත ඇගයීම් 52 ක් සිදු කරන ලදී. 2019 වර්ෂය තුළ නව සහතික 32 ක් නිකුත් කරන ලදී.

විගණකවරුන් දෙදෙනකු කණ්ඩායම් නායක තත්ත්වයට ද, එක් පුහුණු විගණකවරයෙකු විගණක තත්ත්වයට ද උසස් කිරීම මඟින් තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය තවදුරටත් සවිමත් කරන ලදී. RvA ප්‍රතීතනය යටතේ විෂය පථ දහනවයක් (19) පවත්වා ගැනීමට හැකි විය.

2019 වර්ෂය තුළ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු ඇතුළු විවිධ ආයතනවල ප්‍රවර්ධන වැඩසටහන් රැසක් පවත්වන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ආයතන සහතික කිරීමට ශ්‍රී ලං ප්‍ර ආ ට හැකි විය.

RvA සහ SLAB ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ පසුවිපරම් (Surveillance) විගණන සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙහිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි දැරූ විගණන (witness audit) ඇතුළත් විය. සාක්ෂි දැරූ විගණනය ISO 9001: 2015 නව ප්‍රමිතිය මත පදනම් විය.

RvA සහ SLAB විසින් ISO/IEC 17021: 1 කොටස : 2015 ට අනුව වසරක කාලයක් සඳහා ප්‍රතීතන තත්ත්වය දිගටම පවත්වා ගෙන යාමට ශ්‍රී ලං ප්‍ර ආ ට නිර්දේශ කරන ලදී.

ISO 14001: 2015 පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය

ISO 14001 සහතිකකරණ ක්‍රමය යටතේ, අයදුම්පත් 16ක් ලැබී ඇති අතර, ප්‍රමාණවත් විගණන 16 ක්, 1 වන අදියර විගණන 10ක්, 2 වන අදියර විගණන 17ක්, පසුවිපරම් විගණන 82ක් සහ නැවත සහතික කිරීමේ විගණන 09ක් සිදු කරන ලද අතර, 2019 වර්ෂය තුළ නව සහතික 13ක් නිකුත් කරන ලදී.

එක් විගණකවරයෙකු කණ්ඩායම් නායක තත්ත්වයට සහ එක් පුහුණු විගණකවරයෙකු විගණක තත්ත්වයට උසස් කිරීම මගින් පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

RvA සහ SLAB ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ පසුවිපරම් විගණන සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙහිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි දැරූ විගණන ඇතුළත් විය. සාක්ෂි දැරූ විගණන ISO 14001: 2015 නව ප්‍රමිතිය මත පදනම් විය.

RvA සහ SLAB විසින් ISO/IEC 17021: 1 කොටස : 2015 ට අනුව වසරක කාලයක් සඳහා ප්‍රතීතන තත්ත්වය දිගටම පවත්වා ගෙන යාමට ශ්‍රී ලං ප්‍ර ආ ට නිර්දේශ කරන ලදී.

ISO 22000: 2005/ ISO 22000: 2018 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය

සමාලෝචිත වර්ෂය තුළ අයදුම්පත් 38 ක් ලැබී ඇත. ප්‍රමාණවත් විගණන 38 ක්, 1 වන අදියර විගණන 23 ක්, 2 වන අදියර විගණන 22 ක් සහ පසුවිපරම් විගණන 83 ක් සහ නැවත සහතික කිරීමේ විගණන 29 ක් සිදු කරන ලදී. තවද නව සහතික 24ක් නිකුත් කරන ලදී.

එක් විගණකවරයෙකු කණ්ඩායම් නායක තත්ත්වයට සහ එක් පුහුණු විගණකවරයෙකු විගණක තත්ත්වයට උසස් කිරීම මගින් ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය තවදුරටත් සවිමත් කරන ලදී.

RvA සහ SLAB ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ පසුවිපරම් විගණන සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙහිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි දැරූ විගණන ඇතුළත් විය. සාක්ෂි දැරූ විගණන ISO 22000: 2018 නව ප්‍රමිතිය මත පදනම් විය.

RvA සහ SLAB විසින් ISO/IEC 17021: 1 කොටස : 2015 ට අනුව වසරක කාලයක් සඳහා ප්‍රතීතන තත්ත්වය දිගටම පවත්වා ගෙන යාමට ශ්‍රී ලං ප්‍ර ආ ට නිර්දේශ කරන ලදී.

HACCP ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය

සමාලෝචිත වර්ෂය තුළ අයදුම්පත් 19 ක් ලැබී ඇත. ප්‍රමාණවත්තා විගණන 19ක්, අදියර 1 විගණන 13ක්, අදියර 2 විගණන 09ක් සහ නිරීක්ෂණ විගණන 65ක් සහ නැවත ඇගයීම් විගණන 49ක් පවත්වන ලද අතර නව සහතික 11ක් නිකුත් කරන ලදී.

HACCP ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතික කිරීමේ යෝජනා ක්‍රමය එක් විගණකවරයෙකු කණ්ඩායම් නායක තත්ත්වයට සහ එක් පුහුණු විගණකවරයෙකු විගණක තත්ත්වයට උසස් කිරීම මගින් තවදුරටත් ශක්තිමත් කරන ලදී.

RvA සහ SLAB යන ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ නිරීක්ෂණ විගණන සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙහිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි සහිත විගණන ඇතුළත් විය.

ISO/IEC 17021: 1 කොටස : 2015 ට අනුව වසරක කාලයක් සඳහා ප්‍රතීතන තත්ත්වය දිගටම කරගෙන යාමට RvA සහ SLAB විසින් SLSI නිර්දේශ කරන ලදී

OHSAS සහතිකකරණ ක්‍රමය OHSAS 18001 & ISO 450001

OHSAS සහතික කිරීමේ ක්‍රමය OHSAS 18001 සහ ISO 45001 ප්‍රමිතීන් මත පදනම් වේ. මෙම සහතිකය යටතේ 2019 වර්ෂය තුළ අයදුම්පත් 7 ක් ලැබී ඇති අතර ප්‍රමාණවත්තා විගණන 07 ක්, පළමු අදියර විගණන 06 ක්, අදියර 2 විගණන 16 ක් සහ නිරීක්ෂණ විගණන 28 ක් සහ නැවත සහතික කිරීමේ විගණන 08 ක් සිදු කරන ලදී. 2019 වර්ෂය තුළ නව සමාගම් 10 ක් සහතික කර ඇත.

GMP - යහපත් නිෂ්පාදන පිළිවෙත් ක්‍රමය

වර්ෂය තුළ අයැදුම්පත් 209 ක් ලැබී ඇති අතර ප්‍රමාණවත්තා විගණන 200 ක්, පළමු අදියර විගණන 56 ක්, අදියර 2 විගණන 45 ක්, නිරීක්ෂණ විගණන 31 ක් සහ නැවත සහතික කිරීමේ විගණන 09 ක් සිදු කරන ලදී. නව සහතික 86ක් නිකුත් කරන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර GMP යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා, පද්ධති සහතික කිරීමේ අංශය විවිධ දිස්ත්‍රික්කවල කාර්මික සංවර්ධන මණ්ඩලයේ සහයෝගීතාවයෙන් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා ඇත.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තුළ GMP ප්‍රවර්ධනය කිරීම සඳහා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහාය ඇතිව ආරම්භ කරන ලද GMP සහතික කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය.

සුපිරි වෙළඳසැල් සහතිකකරණ ක්‍රමය

සුපිරි වෙළඳසැල් සහතිකකරණ ක්‍රමය SLS 1432: 2011 ප්‍රමිතිය මත පදනම් වේ. සුපිරි වෙළඳසැල් සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කරන ලද අතර කීල්ස් සුපිරි වෙළඳසැල්වල අලෙවිසැල් 99 ක් සහතික කර ඇත. 1 වන අදියර විගණන 10 ක්, 2 වන අදියර විගණන 07 ක්, පසුවිපරම් විගණන 45 ක් සිදු කරන ලදී. නව සහතික 18ක් නිකුත් කරන ලදී.

කාබනික නිෂ්පාදිත සහතිකකරණ ක්‍රමය

කාබනික නිෂ්පාදිත සහතිකකරණ ක්‍රමය SLS 1324 : 2018 මත පදනම් වේ. 1 වන අදියර විගණන 02 ක් සහ 2 වන අදියර විගණන 01 ක් සිදු කරන ලද අතර සහතිකයක් නිකුත් කර නොමැත.

බලශක්ති කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය

බලශක්ති කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය ISO 50001 ප්‍රමිතිය මත පදනම් වේ. සමාලෝචනය සඳහා අයදුම්පත් දෙකක් ලැබී ඇත. 02 ප්‍රමාණවත් විගණන 00, 1 වන අදියර විගණනය, සහ 2 වන අදියර විගණනය සිදු කරන ලද අතර පසුවිපරම් විගණන නවයක් (09) සිදු කරන ලදී. අලුත් සහතික දෙකක් (02) නිකුත් කරන ලදී.

නිර්මාංශ ආහාර සහ බීම පද්ධති සහතිකකරණ ක්‍රමය

නිර්මාංශ ආහාර සහ බීම පද්ධති සහතිකකරණ ක්‍රමය SLS 1460 :2013 මත පදනම් වේ. එක් අයදුම්පතක් ලැබුණි. ප්‍රමාණවත් විගණන 02 ක්, 1 වන අදියර විගණන 02 ක්, 2 වන අදියර විගණන 02 ක් සිදු කර සත්‍යාපන සහතික දෙකක් (02) නිකුත් කරන ලදී.

හරිතාගාර වායු සත්‍යාපනය සහ ප්‍රමාණකරණය

සත්‍යාපනය සඳහා එක් (01) අයදුම්පතක් ලැබී ඇත. එක් (01) ප්‍රමාණවත් විගණනයක්, 1 වන අදියර එක් (01) විගණනයක්, 2 වන අදියර එක් (01) විගණනයක් සිදු කර සත්‍යාපන සහතික 01ක් නිකුත් කරන ලදී.

ආදායම්

2019 වර්ෂය තුළ පද්ධති සහතික කිරීමේ අංශය LKR 80,360,377.00 ක ආදායමක් උපයා ඇත.

වෙනත් ක්‍රියාකාරකම්

1. FSSC 22000 සඳහා නව සහතිකකරණ ක්‍රමයක් ස්ථාපිත කර ඇත.

2. එක් අයදුම්පතක් ලැබීමෙන් තිරසාර ලෙස නිෂ්පාදනය කරන ලද ඉන්ධන දැව සහතිකකරණ ක්‍රමය ආරම්භ කරන ලදී.

3. පද්ධති සහතිකකරණ අංශය මගින් කළමනාකරණ පද්ධති විගණකවරුන් මෙන්ම පද්ධති සහතිකකරණ අංශයට අනුයුක්ත සේවකයින් දැනුවත් කිරීම සඳහා විවිධ මාතෘකා ඔස්සේ පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වා ඇත.

4. අංශයට අනුයුක්ත නිලධාරීන් නිෂ්පාදන සහතික කිරීමේ අංශය, QA අංශය, පුහුණු අංශය, ප්‍රමිති සැකසීමේ අංශය සහ අලෙවි අංශය වෙත සිය සේවය ලබා දී ඇත.

5. විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් GMP / Vidatha/ SLS නිෂ්පාදන/ පද්ධති සහතික කිරීමේ අවශ්‍යතා සහ විගණන ශිල්පීය ක්‍රම පිළිබඳව විදාතා නිලධාරීන් සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. GMP/Vidatha/SLS යෝජනා ක්‍රම සඳහා විගණකවරුන් තෝරා ගැනීම සඳහා විභාග පවත්වන ලදී.

6. තේ මණ්ඩලයේ සහාය ඇතිව ආහාර සුරක්ෂිතතාව පිළිබඳ එක් ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී.

7. පද්ධති සහතිකකරණ අංශයට අනුයුක්ත නිලධාරීන් කිහිප දෙනෙකු සාමාජිකයින් සහ ඡන්දදායකයින් ලෙස සේවය කරමින් ISO තාක්ෂණික කමිටු වෙත තාක්ෂණික යෙදවුම් ලබා දෙන ලදී.

8. අධ්‍යක්ෂ (SC) පාරිසරික කළමනාකරණය පිළිබඳ ජාතික දර්පණ කමිටුවේ ලේකම් ලෙස දිගටම කටයුතු කරයි

9. පද්ධති සහතිකකරණ අංශයේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අමාත්‍යාංශවල උපදේශක කමිටු කිහිපයකට සහභාගී වී රටේ ආර්ථික සංවර්ධනය සඳහා ඔවුන්ගේ වටිනා දායකත්වය ලබා දුන්හ.

10. BMICH හි පැවති ශිල්පසේන ප්‍රදර්ශනය - ශ්‍රී ලංකා තාක්ෂණ විප්ලවයේදී පුද්ගලීකරණය කළ වෛද්‍ය විද්‍යාව යන තේමාව යටතේ තාක්ෂණික කලාපය සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම.

11. වෙනත් රටවලට පද්ධති සහතිකය පුළුල් කිරීම

තත්ත්ව ආරක්ෂණ අංශය

තත්ත්ව ආරක්ෂණ අංශය මගින් කර්මාන්තයෙන් සහ වෙළෙඳාමෙන් ආනයනිත සහ අපනයනය සඳහා වූ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා වැදගත් ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබේ. නිසි පාලනයන් සහ වඩා හොඳ ප්‍රතිඵල සහතික කිරීම සඳහා මෙම යෝජනා ක්‍රම වසර තුළ තවදුරටත් සවිමත් කරන ලදී.

ක්‍රියාත්මක වන ක්‍රම

අ) ආනයන පරීක්ෂාව

මේ වන විට මෙම ක්‍රමය යටතේ නිරීක්ෂණය කරන මුළු අයිතම සංඛ්‍යාව 123 කි.

ආනයන පරීක්ෂා ක්‍රමයේ මාර්ගගත ක්‍රියාකාරිත්වය 2018 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද අතර මෙම මාර්ගගත ක්‍රමය තවදුරටත් වැඩිදියුණු කිරීම් සමඟින් පරිශීලකයින්ට වැඩි පහසුකම් සපයමින් සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

වර්ෂය තුළ, තොග 19490 ක් නිරීක්ෂණය කරන ලද අතර, තොග 9964 කින් නියැදි ලබා ගන්නා ලදී. වර්ෂය තුළ මෙම ක්‍රියාකාරකමෙන් උපයා ඇති මුළු ආදායම රුපියල් මිලියන 194 ඉලක්කයට සාපේක්ෂව රුපියල් මිලියන 216 ක් විය.

මෙම ක්‍රමයේ සඵලතාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස, 2019 වර්ෂය තුළ නිෂ්පාදන ආයතන/ රසායනාගාර ලියාපදිංචි කිරීම තවදුරටත් අඛණ්ඩව සිදු කරන ලද අතර ආනයන පරීක්ෂා ක්‍රමය යටතේ නිෂ්පාදන ආයතන / රසායනාගාර 41ක් ලියාපදිංචි කර

ආ). කජු මද වල අපනයන තත්ත්ව සහතිකය

මෙම ක්‍රමය කජු මද සඳහා ස්වේච්ඡා පදනම මත ක්‍රියාත්මක විය. වත්මන් ක්‍රමය යටතේ 2019 වර්ෂය තුළ ඉල්ලීම් නොලැබුණු බැවින් 2019 වර්ෂය තුළ කිසිදු කජු තොගයක් පරීක්ෂා කර නොමැත.



අංශයේ සමස්ත ආදායම

2019 වර්ෂය සඳහා ශ්‍රී ලං ප්‍ර ආ හි ඉලක්කගත ආදායමේ 29% ධනාත්මක විචල්‍යතාවයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන දායකත්වය වූ LKR මිලියන 194 ඉලක්කයට සාපේක්ෂව අංශය විසින් LKR මිලියන 223 ක සමස්ත ආදායමක් වාර්තා කරන ලදී.

පුහුණු අංශය

කර්මාන්ත/සේවාවන් සඳහා පුහුණුව

ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟ කිරීම සඳහා උසස් තත්ත්වයේ නිෂ්පාදන/සේවා නිපදවීම සඳහා අවශ්‍ය දැනුම පදනම ලබා දීමේ අරමුණින් කර්මාන්තයේ නියුතු පුද්ගලයින්, පෞද්ගලික/රාජ්‍ය අංශයේ ආයතන සහ පුද්ගලයින් සඳහා ප්‍රමිතිකරණය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ ආයතනය විසින් පුහුණුව ලබා දෙයි. ශ්‍රී ලං ප්‍ර ආ විසින් ප්‍රමිතිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන්, ISO 9001 තත්ත්ව කළමනාකරණ පද්ධති, ISO 14001 පරිසර කළමනාකරණ පද්ධති, ISO 22000 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති, ISO 45001 වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂිත කළමනාකරණ පද්ධති වැනි කළමනාකරණ පද්ධති සහ ගුණාත්මකභාවය සහ ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු වැඩසටහන් සියලුම ශ්‍රේණිවල සේවකයින් සඳහා එනම්. ඉහළ කළමනාකාරීත්වය, මධ්‍යම කළමනාකරණය, විධායකයින්, සුපරීක්ෂකවරුන්, කාර්මික ශිල්පීන් සහ වැඩබිම සේවකයින් සඳහා පවත්වනු ලැබේ. මෙම වැඩසටහන් ඉල්ලීම මත සේවාදායක පරිශ්‍රයේදී ද පවත්වනු ලැබේ. 2019 වර්ෂය තුළ ශ්‍රී ලං ප්‍ර ආ විසින් වැඩසටහන් අනූනවයක් (99) පවත්වන ලද අතර පුද්ගලයන් දෙදහස් දෙසිය හැටතුන් දෙනෙකු (2263) පුහුණු කරන ලදී. ගෘහස්ථ පුහුණු වැඩසටහන් පනස් දෙකක් (52) ද පවත්වන ලද අතර පුද්ගලයන් එක්දහස් හාරසිය අනූඑක් (1,491) දෙනෙකු පුහුණු කරන ලදී. ආයතනයේ පුද්ගලයින් හැටඑක් (61) දෙනෙකුට ඉහත විෂයයන් පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

2019 වර්ෂය තුළ නව පුහුණු වැඩසටහන් හයක් (06) එනම්. HACCP / ISO 22000 පිළිබඳ විගණක පුහුණු වැඩසටහන, ISO 22000 : 2018 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති, ISO 9001: 2015 අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, කළමනාකරණ පද්ධති සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, ISO 14001: 2015 අවශ්‍යතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය, සහ රූපලාවණ්‍ය කර්මාන්තය සඳහා GMP පිළිබඳ පුහුණු වැඩසටහන යනාදිය වේ. .

කර්මාන්ත/සේවා සංවිධානවල පිරිස් සහ මෙම ක්ෂේත්‍රවල වාහක සංවර්ධනය අපේක්ෂා කරන පුද්ගලයින් සඳහා වසරක කාලසීමාවක් සහිත තත්ත්ව කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා තුනක් සහ ආහාර තත්ත්ව කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවක් පවත්වන ලදී. තත්ත්ව කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා තුනක් සඳහා එකසිය හැත්තෑදෙකක් (172) සහභාගි වූ අතර ආහාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන සඳහා නිස් තුනක් (33) සහභාගි වූහ.

2019 වර්ෂය තුළ තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා නවයක් (09) පවත්වන ලද අතර මෙම වැඩසටහන් හරහා තුන්සිය පනස් දෙනෙක් (350) පුහුණු කරන ලදී.

කළමනාකරණ පද්ධති පිළිබඳ පුහුණු වැඩසටහන - මොරටුව විශ්වවිද්‍යාලය, සහ ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දින 05) යන විශේෂ වැඩසටහන් දෙකක් ද පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා හැට දෙදෙනෙකු (62) සහභාගී විය.



2019 වසර සඳහා පුහුණු ක්‍රියාකාරකම් තුළින් උපයා ඇති මුළු ආදායම රු. මිලියන 45 කි.

මුද්‍රණ ඒකකය

2019 වර්ෂය තුළ ප්‍රමිති දහයක් (10) මුද්‍රණය කරන ලද අතර පුහුණු වැඩසටහන් සඳහා අත් පත්‍රිකා, විභාග ප්‍රශ්න පත්‍ර, තත්ත්ව පද්ධති ලේඛන, ප්‍රමිතීන් පිළිබඳ ප්‍රවර්ධන ද්‍රව්‍ය, ප්‍රචාරක ද්‍රව්‍ය, දන්ත පත්‍රිකා ආදිය ඇතුළත් 414,968 කට වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කරන ලදී.

අලෙවිකරණ සහ ප්‍රවර්ධන අංශය

මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ ආර්ථිකයේ සෑම අංශයකම ප්‍රමිතිකරණය සහ තත්ත්ව වැඩිදියුණු කිරීම තුළින් ජාතියේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා SLSI හි ආයතනික ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සහ SLSI හි අනෙකුත් තාක්ෂණික අංශවල සේවාවන් ප්‍රවර්ධනය කිරීමයි.

අලෙවිකරණ සහ ප්‍රවර්ධන අංශය 2019 වසරේ රාජ්‍ය/පෞද්ගලික අංශයේ ආයතන අතර SLSIහි සේවාවන් අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම සහ පහත ක්‍රියාකාරකම් සමඟින් ප්‍රජාව දැනුවත් කිරීම;

